**රජයේ මූල්‍ය ප්‍රකාශන - 2018**

**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------------**

2018 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ රජයේ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් වාර්තාව 2017 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 17 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**---------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේවගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි රජයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව රජයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.
වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයේ විගණකාධිපතිවරයා විසින් රජයේ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සිදුකරන ලද මෙම වාර්තාවේ ඇතුලත් අංක 1.6.1.1 (අ) (i) සිට (iv) දක්වා වූ ඡේද, අංක 1.6.1.1 (අ) (vi), 1.6.1.1 (ආ), 1.6.1.2 (අ) (i) ඡේද සහ අංක 1.6.1.5 ඡේද වලට අදාළ නිර්දේශ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 රාජ්‍ය ණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනට රජය විසින් ගෙවිය යුතුව තිබුණු ණය ශේෂය රු. මිලියන 11,276,281 ක් වුවද, නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පහත සඳහන් කරුණු අනුව එම ණය ශේෂය රු.මිලියන 828,377 කින් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (i) | රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධයෙන් වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය 2016 වර්ෂයේ සිට සංශෝධනය කර තිබූ අතර, ඒ අනුව භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවේදී ඒවායේ ශුද්ධ අගය වෙනුවට මුහුණත අගයට ගිණුම්ගත කිරීම ආරම්භකර තිබුණි. එසේ වුවද, 2016 වර්ෂයට පෙර නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කරවල මුහුණත වටිනාකම තවදුරටත් ගිණුම්වලට ගැලපුම් නොකිරීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දින වනවිට මූල්‍ය ප්‍රකාශනවල භාණ්ඩාගාර බැඳුම්කර වලට අදාල මුළු බැරකම රු. මිලියන 344,306 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව ගිණුම්ගත කල යුතුවීම. | 2016 ට පෙර නිකුත්කළ බැඳුම්කරවලට අදාළ අවම්ල එම බැඳුම්කර කල්පිරෙන වර්ෂයේදී ගැලපීම් කිරීමටත්, එතෙක් ගිණුම්වල සටහන් ලෙස එම බැඳුම්කරවල මුහුණත අගය පෙන්නුම් කිරීමටත් පියවර ගනු ලැබේ. |
| (ii) | රජය විසින් ඇතිකර ගත් ගිවිසුම්ගත බැඳීම් යටතේ වූ ණය ගිවිසුම් 08 කට අදාලව 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 366,126 ක් වූ ණය ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | අවශ්‍ය සියළු තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන යාවත්කාලීනව හා නිවැරදිව ඉදිරිපත් කල යුතුවීම. | එම ණය මුදල් යටතේ අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය ව්‍යාපාර ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල සටහන් විය යුතු බැරකමක් වන බැවින් එම වටිනාකම් ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් නොකරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | ඉහත සඳහන් ණය ගිවිසුම් 08 තුළ ඇතුළත් ණය ශේෂ වලින් රු. මිලියන 172,517 ක් හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා රජය විසින් ගනු ලැබ ඇති ණයවලින් ගෙවිය යුතුව තිබූ ශේෂයක් වූ අතර මේ සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද 2017 ජූලි 20 දිනැති "හම්බන්තොට වරාය සහන ගිවිසුම" නම් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට 2017 අගෝස්තු 04 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව, රජය විසින් ගනු ලැබූ ණය වලින් තවදුරටත් ගෙවිය යුතුව ඇති ශේෂය ආපසු ගෙවීමේ වගකීම, එකී සහන ගිවිසුම බලාත්මක වන දිනයේ සිට මහා භාණ්ඩාගාරය විසින් භාරගෙන තිබූ නමුත් එම ණය ශේෂය රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. එසේම, එම ණය ශේෂය වරාය අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවලින්ද ඉවත්කර තිබුණි. | දේශීය හා විදේශීය ණය ගිණුම්ගත කිරීම විධිමත් කල යුතුවීම. | 2017 වර්ෂය දක්වා ණය ගිණුම්ගත කිරීම් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් සිදුකර තිබූ අතර 2017.07.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව මහා භාණ්ඩාගාරය මගින් අදාළ ණය සේවාකරණය පමණක් සිදුකරනු ලබයි.<br><br>එසේම හම්බන්තොට වරාය සඳහා ලබාගන්නා ලද ණය මුදල ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පොත්වල සටහන් විය යුතු බවට මුදල් අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත යෝජනා කරන ලදී. |
| (iv) | 2018 වර්ෂය තුළ උපලබ්ධි වූ විදේශ ණය ගිවිසුම් 50 කට අදාලව රු. මිලියන 39,416 ක් හා විදේශ ණය ගිවිසුම් 15 කට අදාලව 2017 වර්ෂය තුල උපලබ්ධි වූ රු. මිලියන 19,026 ක් ලෙස එකතුව රු. මිලියන 58,442 ක්, 2018 දෙසැම්බර් 31 දින වන විටත්, විදේශ ණය ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | 2017 හා 2018 වර්ෂය තුළ උපලබ්ධි වූ විදේශ ණය ගිවිසුම්වලට අදාළව ගිණුම්ගත කර නොතිබූ රු. මිලියන 58,442 ක වටිනාකම ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන නොමැති නිසා අදාළ අමාත්‍යාංශ විසින් විදේශ ණය ප්‍රතිලබ්ධීන් සහතික කර නොතිබීම හේතුවෙන් ගිණුම්ගත කිරීමට නොහැකි විය. |
| (v) | විදේශ ණය ශේෂ ප්‍රකාශනයේ 2018 දෙසැම්බර් 31 දිනට විදේශ ව්‍යවහාර මුදලින් වූ ණය ශේෂය රුපියල් බවට පරිවර්තනය කිරීමේදී මෙතෙක් ගිණුම්ගත නොකරන ලද ඉහත කී ණය උපලබ්ධීන්ට අදාල වන 2018 දෙසැම්බර් 31 දිනට වන විනිමය ගැලපීමද, ණය ශේෂයට ගලපා තිබුණි. ඒ හේතුවෙන් වර්ෂය අවසානයට වූ විදේශ ණය ශේෂය, විදේශ ණය ගිවිසුම් 36 කට අදාලව රු. මිලියන 9,570 කින් වැඩියෙන් හා විදේශ ණය ගිවිසුම් 02 කට අදාලව රු. මිලියන 13 කින් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | 2019 වර්ෂයේ සිට ගිණුම්ගත නොකරන ලද ණය උපලබ්ධීන්ට අදාළ විනිමය ගැලපීම් වර්ෂය අවසානයේ ගිණුම්ගත කරන ලද ණය ශේෂයෙන් ඉවත් කිරීමට ක්‍රියාකරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | (vi) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේ සිට විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවීම සඳහා වාණිජ බැංකු මගින් ලබාගත් ණය මුදලෙන් 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂය රු. මිලියන 65,110 ක් වූ අතර, එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දේශීය ණය ලෙස හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | -එම- | 2020 වසරේ සිට අදාළ හිඟ ණය මුදල භාණ්ඩාගාර පොත්වලට ඇතුළත් කර වැය විෂය අංක 3001 යටතේ එම ණය වාරික ගෙවීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. |
| | (vii) සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු වූ රු. මිලියන 3,950 ක හිඟ මුදල ගෙවීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මහජන බැංකුවෙන් ණය මුදලක් ලබාගෙන තිබුණු අතර 2017 නොවැම්බර් 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, එම ණය මුදල හා ඊට අදාල පොලිය ගෙවීම එවකට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත භාර දී තිබුණි. එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දේශීය ණය ලෙස හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | -එම- | 2018 වර්ෂයේදී මෙම බැරකම ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට නොහැකි වූ බැවින්, 2019 වර්ෂයේදී ඊට අදාළ ප්‍රතිපාදන සලසාගෙන මෙම බැරකම ගිණුම්ගත කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| (ආ) | රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 වර්ෂය තුල විදේශ ණය ආපසු ගෙවීම් වටිනාකම රු. මිලියන 307,015 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල සටහන 29 (විදේශ ණය ශේෂ ප්‍රකාශන) අනුව එය රු.මිලියන 287,060 ක් පමණක් වීම හේතුවෙන් රු.මිලියන 19,955 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන හා ඊට අදාළ සටහන්වල ඇතුළත් අගයන් නිවැරදි විය යුතු වීම. | රු.19,955,803,734ක ණය ආපසු ගෙවීම්, විදේශ ණය ආපසු ගෙවීම් ලෙස ජනරජ ගිණුමේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 29 හි ඇතුළත් නොවේ. |
| (ඇ) | රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනට මුළු රාජ්‍ය ණය ශේෂය (රජය විසින් කෙටිකාලීන ණය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබා ගෙන ඇති අත්තිකාරම්ද ඇතුළුව), රු. බිලියන 11,467 ක් වූ නමුදු, ශ්‍රී ලංකා මහ බැංකු තොරතුරුවලට අනුව, එදිනට රාජ්‍ය ණය ශේෂය රු. බිලියන 11,977 ක් වූයෙන් රු.බිලියන 510 ක වෙනසක් නිරීක්ෂණය විය. | රාජ්‍ය ණය සම්බන්ධ සියළු වාර්තාවල ඇතුළත් අගයන් එකිනෙකට ගලපා ඊට අදාල සැසඳුම් ප්‍රකාශ ඉදිරිපත් කල යුතුවීම | අදාළ වාර්තා දෙක එකිනෙකට වෙනස් වූ කළමනාකරණ සහ නෛතික අවශ්‍යතා සපුරාලීම සඳහා එකිනෙකට වෙනස් මූලධර්ම යොදා ගනිමින් පිළියෙළ කරනු ලබන බැවින් එම ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු හා එම තොරතුරු ඉදිරිපත් කරන ආකාරයේ වෙනස්කම් පවතී. |

**1.6.2** **උපණය**

---------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2018 ජනවාරි 01 දින වනවිට ලබා දී තිබුණු උපණය රු. මිලියන 181,368 ක් වූ අතර, වර්ෂය තුළදී රු. මිලියන 11,866 ක් උප ණය ලෙස ලබාදී තිබුණි. ඉන් වර්ෂය තුළ අයවීම් රු. මිලියන 25,584 ක් පමණක් වූ අතර වෙනත් ගැලපුම් (විනිමය අනුපාතයන්හි වෙනස්වීම) සමඟ 2018 දෙසැම්බර් 31 දින වනවිට උපණය ශේෂය රු. මිලියන 184,161 ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ------------------------------------------------------ |
| (අ) | ගෝල්ඩන් කී තැන්පත්කරුවන් වෙත ගෙවීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත 2015 හා 2016 වර්ෂ තුළ රු.මිලියන 4,989.9 ක් හා 2017 වර්ෂය තුළ රු.මිලියන 2,500 ක් ලබා දී තිබුණි. ඒ සඳහා උප ණය ගිවිසුම් වලට එළඹ නොතිබුණු අතර උපණය ලෙස ගිණුම්ගත කර ද නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් උපණය ශේෂය රු. මිලියන 7,489 ක් අඩුවෙන් දක්වා තිබුණි. | උපණය ගිවිසුම් අත්සන් කිරීම හා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. | උප ණය ගිවිසුම අත්සන් කිරීමේ කටයුතු නිමකර උපණය ලෙස ගිණුම්ගත කිරීම සඳහා යොමු කරන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019.04.01 දිනැති ලිපියෙන් උපණය ගිවිසුමකට එළඹීම ප්‍රතික්ෂේප කරන ලද බව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇත.<br>උපණය ගිවිසුමකට එළඹීමකින් තොරව උපණය ගිණුම්ගත කිරීමේ හැකියාවක් නොමැති බැවින් උපණය ලෙස මෙම මුදල ගිණුම්ගත කිරීමට නොහැකි වී ඇත. |
| (ආ) | උප ණය ගිවිසුම් 18 කට අදාළව, 2018 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ණය ශේෂයන් සෘජු ශේෂ සනාථ කිරීම් සමග සැසඳීමේදී, උප ණය ශේෂ රු. මිලියන 64 ක් වැඩියෙන් හා රු. මිලියන 93 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. | නිවැරදි හා යාවත්කාලීන වාර්තා හා පොත් පත් පවත්වාගෙන යා යුතු වීම. | (see table below) |

| ආයතනය | වෙනස | වෙනසට හේතුව |
|---|---|---|
| ----------- | ------------ | -------------------- |
| | රු. | |
| NWS & DB<br>ADB 3348 | 10,502,894 | නගර සැලසුම්, ජල සම්පාදන, සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීගේ අංක 2/5/DP සහ 2018.12.31 දිනැති ලිපිය අනුව 2018 වර්ෂයේ උපණය නිදහස් කිරීම නිවැරදිව ගිණුම්ගත කර ඇත. |
| HDFC/NHDA | 3,410,430 | අදාළ නිවැරදි කිරීම් සිදුකිරීමට එම ආයතනයට දැනුම් දී ඇත. |
| CENTRAL BANK | 50,000,000 | මෙම වරද නිවැරදි කිරීමට 2019.05.03 දිනැති ලිපිය මගින් දන්වා ඇත. |
| | -------------- | |
| | 63,913,324 | |

| ආයතනය | වෙනස | වෙනසට හේතුව |
|---|---|---|
| | රු. | |
| Colombo Municipal Council ADB 3348 | 93,186,748 | අදාළ නිවැරදි කිරීම් සිදුකර ගැනීමට එම ආයතනයට දැනුම්දී ඇති අතර මෙම වෙනස නිවැරදි කර ගැනීමට කටයුතු කරමින් පවතී.. |
| PEOPLE'S Bank SMEDeF | 363,310 | -එම- |
| | 93,550,058 | |

**1.6.3 රජය සතු ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) විවිධ රාජ්‍ය ව්‍යවසායන්වල රජයේ ආයෝජන වටිනාකම රු. මිලියන 587,321 ක් වූ නමුත් නියැදි පරීක්ෂාවට අනුව මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන වටිනාකම රු. මිලියන 1,625.3 ක් වැඩියෙන් හා රු. මිලියන 30,430.6 අඩුවෙන් ගිණුම්ගත කර තිබූ බව නිරීක්ෂණය විය. | නිවැරදි හා යාවත්කාලීන වාර්තා හා පොත් පත් පවත්වාගෙන යා යුතුවීම. | (අ) <u>රජය සතු ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වය වැඩියෙන් දැක්වීම</u><br><br>**(i) <u>ශ්‍රී ලංකා තේ මණ්ඩලය</u>**<br><br>ආයතනයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කර ඇති රු.672,012,202 සම්බන්ධව විශේෂ අධ්‍යනය කර භාණ්ඩාගාරයේ ප්‍රාග්ධන දායකත්වය ලෙස නිවැරදි අගය හඳුනාගැනීමට බලාපොරොත්තු වේ.<br><br>(ii) <u>නාගරික සංවර්ධන අධිකාරිය</u><br><br>අධිකාරිය වෙත ලබාදී ඇති රු.1,257,651,060 ක මුදල ආයෝජනයක් ලෙස භාණ්ඩාගාර පොත්වල සටහන් වුවද අධිකාරිය විසින් මෙය භාණ්ඩාගාර ප්‍රදානයක් ලෙස සටහන් කර වාර්ෂිකව ලියාහැරීම සිදු කරනු ලැබේ. කෙසේ වුවද මුදල් පනතේ 18 වන වගන්තියට අනුව එවැනි ලියාහැරීමක් සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාදිය යුතුවේ. |

(iii) <u>ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව</u>

වෙනසට හේතු වී ඇති රු.10,000,000 හා සම්බන්ධ ගැලපීම සංස්ථාව විසින් 2012 වර්ෂය තුළදී සිදු කර ඇති බව නිරීක්ෂණය කරනු ලබන අතර අමතර තොරතුරු සොයා බලා නිසි ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගන්නා ලදී.

(iv) <u>සිලෝන් ෂිපින් ලයින් ලිමිටඩ්</u>

අදාළ ආයෝජිත වටිනකම භාණ්ඩාගාරයේ පොත්වල ගැලපීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

**(ආ)** <u>රජය සතු ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වය අඩුවෙන් දැක්වීම</u>

**(i)** මහා භාණ්ඩාගාරය විසින් කොමර්ෂල් බැංකුව වෙත සිදුකරන ලද ආයෝජනය සඳහා ලද ලාභාංශය වෙනුවෙන් නිකුත් කර ඇති කොටස් ප්‍රමාණය භාණ්ඩාගාරයේ පොත්වල සටහන් නොවීම හේතුවෙන් මෙම වෙනස පැන නැගී ඇත.

**(ii)** <u>ජාතික සංවර්ධන බැංකුව</u>
2018 වර්ෂයේ ජාතික සංවර්ධන බැංකුව විසින් මහා භාණ්ඩාගාරය වෙත ලබාදෙන ලද රු.2,611,839.78 ක් වටිනා ලාභාංශ වෙනුවෙන් නිකුත් කරන ලද කොටස් 19,247 ක ප්‍රමාණය අදාළ වෙනසට හේතු වේ.

**(iii)** <u>කොටගල වැවිලි සමාගම</u>

කොටගල වැවිලි සමාගම විසින් 2018.01.09 වන දිනට පැවති කොටස් දෙකකට තුනක් (2:3) වන අනුපාතය යටතේ සිදුකරන ලද කොටස් උප බෙදීම හේතුවෙන් (සමුච්චිත ප්‍රාග්ධනය ඉහළ දැමීමකින් තොරව) භාණ්ඩාගාරය සතු කොටස් ප්‍රමාණය කොටස් 5,700,834 ක් ලෙස ඉහළ ගොස් තිබේ. භාණ්ඩාගාරයේ පොත්වල අදාළ ගැලපීම් සිදුකිරීමට සටහන් කර ගතිමි.

**(iv) <u>ප්‍රාදේශීය සංවර්ධන බැංකුව</u>**

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් වන ප්‍රතිෂ්ඨාව වශයෙන් ඒකාභවන ලද රු. 4,176,292,999 ක වටිනාකම (කොටසක් රුපියල් 26.43 ක් බැගින් කොටස් 158,013,356 ක්) නියෝජනය වන පරිදි ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් මහා භාණ්ඩාගාරය වෙත නිකුත් කරන ලද කොටස් වටිනාකම හේතුවෙන් අදාළ වෙනස පැන නැගී ඇත.

**(v) <u>ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩලය</u>**

ජල සහ අපජල ව්‍යාපෘතිවල ණය ආපසු ගෙවීම් හා එහි පොළිය ගෙවීම වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් ලබාදුන් අරමුදල් මණ්ඩලය විසින් භාණ්ඩාගාරයේ නිර්දේශයකින් තොරව භාණ්ඩාගාරයේ ප්‍රාග්ධන දායකත්වය ලෙස හඳුනාගැනීම හේතුවෙන් වෙනස සිදු වී ඇත.

**(vi) <u>ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය</u>**

භාණ්ඩාගාරයේ පොත්වල සටහන් කර තිබූ 2016.12.31 දින දක්වා ලබාදෙන ලද රු.632,659,758.77 ක වටිනාකමට අමතරව පසුකාලීනව ලබාදෙන ලද රු.58,502,029.89 ක්ද ඇතුළත්ව රු.691,161,788.66 ක් ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය විසින් 2018.12.31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය තුළ භාණ්ඩාගාරයේ ප්‍රාග්ධන දායකත්වය ලෙස හඳුනාගෙන ඇත. අදාළ වටිනාකම භාණ්ඩාගාරයේ පොත්වල ගැලපීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

## 1.6.4 අසම්භාව්‍ය බැරකම් හා බැදීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් භාණ්ඩාගාර ඇපකර මත දේශිය ආයතන වෙතින් ලබාගත් ණය මුදල් පියවීම සඳහා, එම ණය වාරික හා පොළී වටිනාකමට සමාන මුදලක් මහා භාණ්ඩාගාරය විසින් උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශයේ 117-02-04-51-2506 දරන වැය විෂය යටතේ වාර්ෂිකව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලබාදීම සිදු කෙරේ. ඉහත කී පරිදි, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දේශීය වාණිජ බැංකු හා විශේෂිත බැංකු වෙතින් ලබාගත් දේශීය ණය වලින් 2018 දෙසැම්බර් 31 දින වන විට ණය ගිවිසුම් 94 ක් යටතේ ලබාගෙන තිබුණු රු. මිලියන 180,121.60 ක් හා එක් ණය ගිවිසුමක් යටතේ ලබාගෙන තිබුණු එක්සත් ජනපද ඩොලර් මිලියන 35.45 ක (රු. මිලියන 6,478.48) ශේෂයක්, මූල්‍ය ප්‍රකාශන තුල අසම්භාව්‍ය බැරකම් හා බැදීම් යටතේ දක්වා තිබුණි.<br><br>ඒ අනුව ණය සේවාකරණ වගකීම සම්පූර්ණයෙන්ම මහා භාණ්ඩාගාරය විසින් දරනු ලැබුවද, රු.මිලියන 186,600.08 ක් වූ දේශීය බැංකු වෙතින් ලබාගෙන තිබුණු ඉහත ණය ශේෂය බැරකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. එසේම එය වාර්ෂික බැරකම් සීමාව ගණනයේදීද අදාල කරගෙන නොතිබුණි. | අවශ්‍ය සියළු තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන යාවත්කාලීනව හා නිවැරදිව ඉදිරිපත් කල යුතුවීම. | ණය මුදල වෙනුවෙන් භාණ්ඩාගාර ඇපකර නිකුත් කර ඇති බැවින් මෙය මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය බැරකම් යටතේ දක්වා ඇත. තවද මෙම ණය ලබාගෙන ඇත්තේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වන අතර එම ණය මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල බැරකමක් ලෙස දක්වා ඇති බැවින් භාණ්ඩාගාරය විසින් මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය බැරකමක් ලෙස හඳුනාගෙන නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 අයවැය යෝජනා අනුව බලපත්‍ර ලාභී වාණිජ බැංකුවල හෝ විශේෂ බලපත්‍රලාභී බැංකුවල ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් පවත්වාගෙන යනු ලබන රුපියල් මිලියනයක් හෝ ඊට අඩු ස්ථාවර තැන්පතු සඳහා සියයට 15 ක පොළී ප්‍රතිශතයක්ද 2017 වර්ෂයේ සිට රුපියල් මිලියන 1.5 ක් හෝ ඊට අඩුවෙන් පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු සඳහා සියයට 15 ක පොළී ප්‍රතිශතයක් ගෙවනු ලබයි. එම පොළී අනුපාතය හා සාමාන්‍ය පොළී අනුපාතය අතර වෙනසට අදාළ මුදල්, මහා භාණ්ඩාගාරය විසින් අදාල බැංකුවලට ප්‍රතිපූර්ණය කලයුතු විය. 2018 දෙසැම්බර් 31 දින වන විට රාජ්‍ය බැංකු 07 කට හා පෞද්ගලික බැංකු 22 කට එලෙස ගෙවිය යුතු එම පොළී සහනාධාරය රු.මිලියන 33,198.08 ක් වී තිබුණි. එම බැරකම මූල්‍ය ප්‍රකාශන තුල හෙලිදරව් කර නොතිබුණු අතර අදාල ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුලද හෙලිදරව් කර නොතිබුණි. | අවශ්‍ය සියළු තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන යාවත්කාලීනව හා නිවැරදිව ඉදිරිපත් කල යුතුවීම. | 2018 වර්ෂය සඳහා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා පොළී සහනාධාර ගෙවීමට අක් මුදල් නොලැබීම හේතුවෙන් වර්ෂය තුලදී කිසිදු ගෙවීමක් සිදුකර නොමැත. |
| (ඇ) | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (බස්නාහිර පළාත) වෙත 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය අවසානය දක්වා හිඟ කොන්ත්‍රාත් වගකීම් නිරවුල් කිරීම සඳහා, 2016 පෙබරවාරි 01 දින අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පත්කල කමිටුවක් විසින් ගෙවීම් සඳහා නිර්දේශය ලබා දී තිබුණු රු. මිලියන 3,224 ක් එම අධිකාරියේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුල මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු බවට ඇතුලත්ව තිබුණි. එහෙත් රජයේ මූල්‍ය ප්‍රකාශන තුල බැරකම් යටතේ එම වටිනාකම ඇතුලත් කර නොතිබුණි. | අවශ්‍ය සියළු තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන යාවත්කාලීනව හා නිවැරදිව ඉදිරිපත් කල යුතුවීම. | 2018 වර්ෂයේදී මෙම බැරකම ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට නොහැකිවීම මත ගිණුම්ගත කර නොමැත. |

### 1.6.5 අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 දෙසැම්බර් 18 දින පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුව වෙනුවෙන් මිළදී ගෙන තිබූ වාහන 82 ක් විකිණීමේදී සිදුව තිබූ රු. මිලියන 400 ක පාඩුව, 2018 දෙසැම්බර් 31 දින වනවිටත් පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබූ අතර, ඊට හේතු විගණනයේදී අනාවරණය නොවීය. එසේම, වසර 04 කට අධික කාලයක සිට පැවත එන මෙම වටිනාකම තවදුරටත් මූල්‍ය ප්‍රකාශනයෙහි අවිනිශ්චිත ගිණුමෙහි ඇතුළත් කර තිබුණි. | තාවකාලිකව අවිනිශ්චිත ගිණුමේ රඳවාගත් මුදල් හැකි ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුව වෙනුවෙන් මිලදීගන්නා ලද වාහන 82 ක් විකිණීමේදී සිදුවූ රු. මිලියන 400 ක පාඩුව කපාහැරීම හෝ වගකිව යුතු පාර්ශවයන් සිටීනම් ඔවුන්ගෙන් එම මුදල අයකර ගැනීම සඳහා දැනට පරීක්ෂණයක් සිදුකරමින් පවතී. |

### 1.6.6 නිරවුල් නොවූ ශේෂ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 රජයේ මූල්‍ය ප්‍රකාශන තුල දීර්ඝ කාලයක් තිස්සේ අක්‍රියව පවතින ගිණුම් 08 කට අදාලව රු. මිලියන 1,188.1 ක හර ශේෂ හා ගිණුම් 06 කට අදාල රු. මිලියන 2,960 ක බැර ශේෂ නිරවුල් නොකර දිගින් දිගටම මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල ඇතුලත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුළ නිරවුල් හා යාවත්කාලීන අගයන් ඇතුළත් කළ යුතු වීම. | තවදුරටත් පවත්වාගෙන යාම අවශ්‍ය නොවන හර ශේෂ සහිත ප්‍රධාන ලෙජර් ගිණුම් පොත්වලින් කපාහැරීමටත් බැර ශේෂ සහිත ප්‍රධාන ලෙජර් ශේෂ රාජ්‍ය ආදායමට බැර කර පද්ධතියෙන් ඉවත් කිරීමටත් අවශ්‍ය පියවර ගනු ලැබේ. |

### 1.6.7 විදේශ ප්‍රදාන

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව ආයතන 05 ක් විසින් සමාලෝචිත වර්ෂය තුල රු. මිලියන 341 ක විදේශ ප්‍රදාන සෘජුවම අදාළ ආයතන වෙත ලබාගෙන තිබුණි. මෙම ප්‍රදානයන් පිළිබඳ තොරතුරු මහා | චක්‍රලේඛන විධිවිධාන ප්‍රකාරව විදේශ ආධාර ලබා ගැනීම හා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතුවීම | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 න් සංශෝධිත 2.0 ඡේදය ප්‍රකාරව හා මුදල් රෙගුලාසි සංග්‍රහයේ XI පරිච්ඡේදයෙහි වූ විධිවිධාන නොසළකා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනු දැනුමකින් තොරව සෘජුවම විදේශ ප්‍රදාන ලබාගන්නා රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි |

| | | |
|---|---|---|
| භාණ්ඩාගාරයේ වාර්තාවල ඇතුළත් වී නොතිබුණු අතරම වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත මෙවැනි ආධාර ලැබී තිබේද යන වග තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් මහා භාණ්ඩාගාරය සතුව නොමැති බව නිරීක්ෂණය විය. | | කටයුතු කරන ලෙස රේඛීය අමාත්‍යාංශය භාර ලේකම්වරුන් වෙත උපදෙස් නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.<br>(i) චක්‍රලේඛ විධිවිධාන නොසළකා ලබාගත් සෘජු විදේශ ප්‍රදාන වහාම විධිමත් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලෙස.<br>(ii) ඉදිරියේදී කිසිදු හේතුවක් නිසාවෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමකින් තොරව/අනුමැතිය ලබාගැනීමකින් තොරව විදේශ ප්‍රදාන ලබාගැනීමට කටයුතු නොකළ යුතු බව. |
| (ආ) 2018 වර්ෂය තුල විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත විදේශ ප්‍රදාන ලෙස ලැබෙන මුදලින් අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා එක් එක් වැය විෂයයන් යටතේ එකතුව රු. මිලියන 4,097 ක අයවැය ප්‍රතිපාදන ලබාදී තිබුණත්, වර්ෂය තුළ උපයෝජනය කර තිබුණේ රු. මිලියන 2,183 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 53.3 ක් පමණි. එසේම සමාලෝචිත වර්ෂය තුල විදේශ ප්‍රදාන ව්‍යාපෘති සඳහා වෙන්කල රු. මිලියන 1,914 ක අයවැය ප්‍රතිපාදන ඉතිරිව තිබියදීත් වර්ෂය අවසානයට රු. මිලියන 1,322 ක් අදාල කාර්යයන් සඳහා භාවිතා නොකොට, විදේශ ප්‍රදානයන් ලෙස ගිණුම්ගත නොකර පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | විදේශ ප්‍රදාන උපයෝජනය කිරීම විධිමත් කල යුතුවීම | මෙම තත්ත්වය වළක්වාලීම/ අවමකිරීම සඳහා පාලනයෙන් බැහැර අවස්ථාවන් හැරුණු කොට විදේශ ප්‍රදාන මත සලසා දුන් අයවැය ප්‍රතිපාදන ඌණ උපයෝජනය සම්බන්ධයෙන් පිළිගත හැකි හේතු අදාළ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු බවට අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත ලබාදීමට නියමිත උපදෙස්හි ඇතුළත් කිරීමට පියවර ගනු ලැබේ. |

**1.6.8 මූල්‍ය නොවන වත්කම්**

**-------------------------**

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් (Non-Financial Assets) වටිනාකම රු. මිලියන 1,087,398 ක් විය. ඊට අදාල, මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 16 හි ඇතුලත් 2018 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් නියැදි පදනම මත තෝරාගත් ආයතන 93 ක, වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල 2018 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය නොවන වත්කම් ශේෂය, සමඟ සැසඳීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) නියැදි පදනම මත තෝරාගත් ආයතනවල, මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන මූල්‍ය නොවන වත්කම් ශේෂයේ එකතුව රු. මිලියන 19,664 ක් රජයේ මූල්‍ය ප්‍රකාශන තුල ගිණුම්ගත වී නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම් ගිණුමගත කිරීම විධිමත් කළ යුතුවීම. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී, ගණන්දීමේ නිලධාරී හා ප්‍රධාන මූල්‍ය නිලධාරී විසින් අදාළ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු භාණ්ඩාගාර පොත් සමඟ සසඳන ලද බවටත් එ්වා සමඟ එකඟ වන බවටත් සහතික කර ඇත.<br><br>පළමු පරිපූරක ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීමට පෙර, 2018 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසානය තෙක් සියළු ගනුදෙනු හා සටහන් භාණ්ඩාගාර පොත්වල ගිණුම්ගත වීම සමඟ සසඳා තහවුරු කර අවශ්‍ය ගැලපීම් සිදුකිරීම වියදම් ශීර්ෂවලට අදාළව කටයුතු කරන ප්‍රධාන මූල්‍ය නිලධාරීන්ගේ/ ප්‍රධාන ගණකාධිකාරීන්ගේ වගකීම වේ. |
| (ආ) තෝරාගත් ආයතන 15 ක, මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු. මිලියන 15,655 ක් වී තිබුණද, අදාල ආයතනයන්හි ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂය රු. මිලියන 2,875 ක් පමණක් වීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු. මිලියන 12,780 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය නොවන වත්කම් ගිණුමගත කිරීම විධිමත් කළ යුතුවීම. | |
| (ඇ) තෝරාගත් ආයතන 19 ක, මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු. මිලියන 189,587 ක් වී තිබුණද, අදාල ආයතනයන්හි ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂය රු. මිලියන 267,177 ක් වීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් වටිනාකම මිලියන 77,590 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ | අවිනිශ්චිත අවස්ථා අරමුදලින් අත්තිකාරම් මුදලක් දුන් සෑම අවස්ථාවකම එම මුදල | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ | අංක 2064/26 හා 2018.03.28 දින දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති විෂයයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන සලසාදීමේ |

| | | | | |
|---|---|---|---|---|
| | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 151 ව්‍යවස්ථාව | ආපසු ගෙවීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් අප්‍රමාදව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතු වුවද, ව්‍යාපෘති කළමනාකරණ, තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය වෙත 2018 අප්‍රේල් 27 දින අවිනිශ්චිත අවස්ථා අරමුදලින් ලබාදී තිබූ රුපියල් මිලියන 50 ක් ණු අතර, 2019 අප්‍රේල් 23 දින වන විටත් එසේ පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර අවිනිශ්චිත අවස්ථා අරමුදලින් ලබාගත් අත්තිකාරම් මුදල පියවීමට කටයුතු කර නොතිබුණි.<br><br>ඒ අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ අවිනිශ්චිත අවස්ථා අරමුදලේ ශේෂය රුපියල් මිලියන 450 ක් පමණක් දක්වා තිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතුවීම. | මූලික පියවරක් ලෙස ව්‍යාපෘති කළමනාකරණ, තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය වෙත රුපියල් මිලියන 50 ක අත්තිකාරමක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. ඒ සඳහා බලය ලබාදෙමින් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2018 අංක 01 දරණ අත්තිකාරම් වොරන්ට් බලපත්‍රය 2018.04.11 දින නිකුත් කර ඇත.<br><br>2018 වර්ෂයේ අවසාන කාර්තුවෙහි පැවති දේශපාලන වාතාවරණය නිසා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමේ හැකියාව සීමා විය. එබැවින් ඉදිරියේදී පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර අදාළ අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| (ආ) | 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3 (අ) ඡේදය | "2006 වර්ෂය අවසානයේ අයවැය පරතරය, එම වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත කරන ලද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 05 ක් නොඉක්මවන බවට සහ එම මට්ටම ඉන්පසු දිගටම පවත්වාගෙන යනු ලබන බවට වගබලා ගැනීමෙන් ආණ්ඩුවේ ණය දූරදර්ශී මට්ටම් දක්වා අඩු කිරීම" ආණ්ඩුව විසින් අනුගමනය කළයුතු වගකීම් සහිත මූල්‍ය කළමනාකරණයට පාදකවූ පරමාර්ථයක් වුවද, ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂය තුළ, එම එකිනෙක වර්ෂ අවසානයට වූ අයවැය පරතරය එම වර්ෂවලට | පනතේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතුවීම. | රාජ්‍ය ආදායම අපේක්ෂිත පරිදි වර්ධනය නොවීම මෙන්ම ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම තුළින් ඇතිකළ පීඩනයෙහි බලපෑම, රටතුළ ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය තුළින් දිළිදුකම පිටුදැකීම හා දේශීය මෙන්ම විදේශීය ආයෝජන අවස්ථා පුළුල් කිරීම අරමුණු කරගනිමින් රාජ්‍ය ආයෝජන අවස්ථාපුළුල් කිරීම ආදිය තුළින් මෙන්ම අනපේක්ෂිත අයුරින් සිදුවූ හදිසි ආපදා තත්ත්වයන් සඳහා සහන සැලසීම යනාදී තරුණු හේතුවෙන් රාජ්‍ය වියදමට ඇතිකරන ලද බලපෑම, අයවැය හිඟය අපේක්ෂිත මට්ටමේ පවත්වාගැනීම කෙරෙහි පීඩනයක් ඇතිකරන ලදී. |

| | | | | |
|---|---|---|---|---|
| | | අදාළ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන පරිදි පවත්වාගෙන යාමට මුදල් අමාත්‍යාංශය අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රතිශතයන් පිළිවෙලින් ඇස්තමේන්තුගත අයවැය පරතරයට අදාලව සියයට 7.38 ක් හා තත්‍ය අයවැය පරතරයට අදාලව සියයට 5.62 ක් විය. | | |
| (ඇ) | 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතින් සංශෝධිත 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත | යම් වර්ෂයක් අවසානයට පැවතිය හැකි උපරිම බැරකම් වටිනාකම එම වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 80 නොඉක්මවිය යුතුය. එම සීමාවන්ට අනුගතව මුදල් අමාත්‍යාංශය කටයුතු කර ඇති බව අමාත්‍යාංශ වාර්තා අනුව විද්‍යාමාන වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට බැහැරින් ගිණුම් තබා ඇති එහෙත් විවිධ රාජ්‍ය ව්‍යවසාය වලට අදාල බැරකම්ද සැලකිල්ලට ගත්විට එම අදාල සීමාවන් ඉක්මවා එනම් මුළු බැරකම දළ දේශීය නිශ්පාදිතයෙන් සියයට 88 ක් වී තිබූ බව නිරීක්ෂණය විය. | පනතේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතුවීම. | i. වර්ෂය තුළ බැරකම් සීමාවන් ගණනය කිරීමේදී බැරකම් ලෙස සළකනුයේ නිශ්චිතව හඳුනාගත් නිශ්චිතව ගෙවීමට සිදුවන බැරකම්ය. 2003 අංක 3 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ (සංශෝධිත) අංක 3 (ඊ) වගන්තියට අනුව රජයේ බැරකම් සීමාව ඒ මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද දළ ජාතික නිෂ්පාදිතයෙන් 80% ක් තුළ විය යුතු විය. එම පනතේ අංක 3(ඉ) වගන්තියෙන් දැක්වෙන පරිදි රජයේ අසම්භාව්‍ය වගකීම් සීමාව පසුගිය වර්ෂ තුනක දළ ජාතික නිෂ්පාදිතයේ සාමාන්‍යයෙන් 10% ක් තුළ විය යුතුය. ඒ අනුව රජයේ බැරකම් සහ අසම්භාව්‍ය වගකීම් සඳහා වෙන වෙනම සීමාවන් පනවා ඇත.<br><br>ii. ශේෂ පත්‍රයෙන් පිටත ගිණුම් තබා ඇති විදේශ ණය ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම යන රාජ්‍ය ව්‍යාපාර ආයතනවලට අදාළ මූල්‍ය ප්‍රකාශනවල සටහන් වන බැවින් මෙම වටිනාකම ජනරජ ගිණුමේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරනු නොලැබේ. ඒ අනුව රුපියල් බිලියන 366 ක මුදලද මුළු බැරකම් සීමාවට ඇතුළත් නොවේ. |

iii. 2016 වර්ෂයේ සිට භාණ්ඩාගාර බැඳුම්කර මුහුණත අගයට ගිණුම් තැබීමට කටයුතු කර ඇති අතර විගණන වාර්තාවේ අඩුවෙන් ගිණුම්ගත කළ භාණ්ඩාගාර බැඳුම්කර ශේෂය වශයෙන් දැක්වෙන රුපියල් බිලියන 344 ක මුදල, 2016 වර්ෂය දක්වා නිකුත් කර තිබූ භාණ්ඩාගාර බැඳුම්කර මුහුණත අගය සහ පොත් අගය අතර වෙනස වේ.